**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරිම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 04 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය

හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ජේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ජේදයේ සිට 2.20 දක්වා ජේදවල සඳහන් කර ඇත. මුල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| | **මුදල් රෙගුලාසි 128(1)- ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ජේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසිය | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට | 1. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරිම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.5.1 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.14.1(අ) |
| | | 3. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.16 |

| | | | |
|---|---|---|---|
| | පරිශ්‍රමයක් දක්වා තිබීම | 4. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.18 |
| | | 5. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2(ආ) |
| | | 6. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.5.2 |
| | | 7. වත්කම්වල වටිනාකම හා ගුණාත්මකභාවය අඩුවීම | 2.6(ඈ) |
| | | 8. අනාර්ථික ගනුදෙනු | 2.10 |
| | | 9. දේශීය ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටුනොවීම | 2.4.1(අ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2(ආ) |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.5.2 |
| | | 3. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.13 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.18 |

| | | | |
|---|---|---|---|
| | ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 2. අනුකූල නොවීම් | 2.19.1 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.15(අ) |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල්, භාණ්ඩ, උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.6 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරීම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.5.1 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.14.1(අ) |
| | | 3. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.16 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම | 2.15 |

| | | | |
|---|---|---|---|
| | වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව | සම්බන්ධයෙන් | |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙයින් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.15 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව (මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරිම නොව, වියදම් කරනු ලබන මුදල මගින් රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරිම) | 1. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.2.(ආ) |
| | | 2. අවිධිමත් ගනුදෙනු | 2.8 |
| | | 3. අනාර්ථික ගනුදෙනු | 2.10 |
| | | 4. ව්‍යාපෘති අවිච්ඡේදවීම | 2.4.1(ආ) |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව (මු.රෙ.150 බලන්න) | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.14.2 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් | 1. වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබිම | 2.6.(ඇ) |

| | | |
|---|---|---|
| රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව<br><br>(වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | 2. පාඩු හා හානි | 2.9 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

-------------------------------------------------------

(අ) මුහුද ගොඩගැලීම්, නියඟ, ගංවතුර, සුළිසුළං, වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම තුලින් ජනතාවගේ ජනජීවිතය යථා තත්ත්වයට පත්කිරීම හා ස්ථාවර කිරීම

(ආ) දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම

(ඇ) දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම

(ඈ) විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම

(ඉ) දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 16 දෙනා සමඟ ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියාකිරීම හා එහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම

(ඊ) පරිපාලන කටයුතුවලදී ඵලදායිතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම

(උ) දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතනවල අරමුණු පරමාර්ථ හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම

(ඌ) සියළුම මැතිවරණ කටයුතුවලදී එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණවලදී මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට කටයුතු කිරීම

(එ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ අභිප්‍රේරණ සහ හැකියා වර්ධනයට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම

(ඒ) විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා මණ්ඩල හා සම්බන්ධ ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක්රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම සහ අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීම

(ඔ) විදේශ ආධාර ව්‍යාපෘති හා දේශීය අරමුදල් ව්‍යාපෘති සුපරීක්ෂණය හා අධීක්ෂණය මගින් වත්කම් කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම

**2.2 කාර්යසාධනය**
----------------

**2.2.1 සැලැසුම් කිරීම**
----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 08 ක් පැවැති අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**
----------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දික්වැල්ල, තිහගොඩ, පිටබැද්දර, හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අමතර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.මිලියන 157.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. දික්වැල්ල හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි අමතර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ

විදුලිය පද්ධතිය නවීකරණය සඳහා රු.මිලියන 0.80 ක ප්‍රතිපාදන සලසා තිබුණත් එම කාර්යය ඉටුකර නොතිබුණි. දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිගණක ඒකකය පිහිටුවීම සඳහා රු.මිලියන 0.30 ක ප්‍රතිපාදන සලසා තිබුණත් එම කාර්යය ඉටුකර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාතර නිල්වලා ව්‍යාපෘතියට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 1.82 ක් වූ ව්‍යාපෘති 02 ක් සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණත් එම කාර්යය ක්‍රියාත්මක නොකර අවලංගු කර තිබුණි.

(ii) මාතර නිල්වලා නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙල්ගල්ල තල්පාවිල ප්‍රධාන මාර්ගයේ පැති බැම්ම සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 1.79 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.18,716 ක් වැයකර තිබුණි. එම වැඩ කොටස්වල ප්‍රමිතිය ද දුර්වල මට්ටමක පැවතුණි. 2018 වර්ෂයේදී ප්‍රතිපාදන නොලැබීම මත මෙම කර්මාන්තයේ වැඩ නතර කර තිබුණි.

(iii) අංක 262-1-1-0-2509 දරන වැය විෂය යටතේ ගංවතුරෙන් හානියට පත් මාර්ග හා යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණයට අනුමත වූ ව්‍යාපෘති 10 ක් සඳහා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.මිලියන 7.5 ක් වූ ප්‍රතිපාදන සලසා තිබූ නමුත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. තවද කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 3.50 ක් වූ ව්‍යාපෘති 04 ක් සහ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිවිසුම්ගත වටිනාකම රු.915,141 ක් වූ එක් කර්මාන්තයක් ද ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි.

## 2.3 තිරසර සංවර්ධනය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අවධානය යොමු කර නොතිබුණි. එමෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කර ගත යුතුව ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක 2018 මැයි 28 දින වන විටත් හඳුනාගෙන ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.4 ක්‍රියාත්මක කර තිබුණු දේශීය ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 14 ක් සඳහා එකතුව රු. මිලියන 2,603.04 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 820.34 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 1,782.70 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 68 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) දේශීය ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම

ව්‍යාපෘති 10 ක ඇතුළත් කර්මාන්ත 205 ක් ප්‍රමාණවත් කාලයක් නොතිබීම, විධිමත් පරිදි සැළසුම් කර ක්‍රියාත්මක නොකිරීම, වෙනත් ආයතන විසින් ක්‍රියාත්මක කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ අධීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණ නිලධාරීන්ගේ හිඟය යනාදී විවිධ හේතු නිසා අත්හැර දමා තිබුණි. ඉන් හඳුනාගත හැකි කර්මාන්ත 124 ක වටිනාකම රු. මිලියන 123.02 ක් වී තිබුණි.

### (ආ) ව්‍යාපෘතිය අවිච්ඡේදවීම

ව්‍යාපෘති 10 කට අදාළව ක්‍රියාත්මක කර තිබුණු කර්මාන්ත 157 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට නිම කිරීමට අපොහොසත් වී තිබීම නිසා එකී කර්මාන්ත 2018 වර්ෂයට අවිච්ඡේද වී තිබුණි. එම අවිච්ඡේද වූ කර්මාන්තවල වටිනාකම රු.මිලියන 820.61 ක් වී තිබුණි.

## 2.5 ප්‍රසම්පාදනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 2,076 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 488 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම සඳහා අනුගමනය කර තිබුණු ප්‍රතිපාදන ක්‍රියාවලියේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රු.මිලියන 281 ක් වූ ප්‍රතිපාදන වෙන්වී තිබුණු මාතර නිල්වලා නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර නොතිබුණු අතර කොන්ත්‍රාත් ගොනුකරණ කටයුතු ද නිසි පරිදි සිදුකර නොතිබුණි.

(ආ) පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස්කර තිබුණු මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 138 ක් වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 මාර්ගෝපදේශයට පටහැනිව අනුමත අධිකාරී සීමාව ඉක්මවා දිස්ත්‍රික් ලේකම් විසින් ඉහත මුළු පිරිවැය ඇස්තමේන්තුව 2017 සැප්තැම්බර් 11 දිනැති ලිපිය මගින් අනුමත කර තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් (මුලටියන, වැලිගම, තිහගොඩ) අවස්ථා 59 කදී එකතුව රු.මිලියන 12.12 ක සැපයුම් හා සේවා ලබා ගැනීමේදී අනුමත ප්‍රසම්පාදන කමිටු මගින් සිදුකර නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් සඳහා 2017 වර්ෂයට පිළියෙල කර තිබුණු ප්‍රතිපාදන සැලැස්ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව පිළියෙල කර කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් (මුලටියන, වැලිගම, දික්වැල්ල, කොටපොල, වැලිපිටිය, තිහගොඩ) විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 සහ 4.3.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන සහ කාලරාමුව පිළියෙල කර නොතිබුණි.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටුව, ප්‍රසම්පාදන කමිටුව විසින් පත්කළයුතු වුවත්, ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා නොගෙන ලංසු විවෘත කිරීමේ කමිටුව පත්කර තිබුණි.

(උ) වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.මිලියන 12.58 ක ප්‍රසම්පාදන තීරණ ගැනීම් අවස්ථා 15 කට අදාළ වාර්තා සටහන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය ප්‍රකාරව පැමිණ සිටින සාමාජිකයින් විසින් අත්සන් යොදා සහතික සිදුකර නොතිබුණි.

(ආ) අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 7.81 ක වියළි සලාක මිලදී ගැනීම් වෙනුවෙන් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබාදී තිබුණි. එය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව හදිසි අවස්ථාවල ප්‍රසම්පාදන කාර්ය පරිපාටියෙන් බැහැරවීම සඳහා වූ අධිකාරී සීමාව ඉක්මවා තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් (මාතර, කඹුරුපිටිය, පිටබැද්දර, තිහගොඩ) එකතුව රු.මිලියන 1.81 ක් වූ පරිගණක, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1(අ) හා 5.6.1 (ඇ) මාර්ගෝපදේශ වලින් බැහැරව කටයුතු කර තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 1.81 ක් වටිනා පරිගණක උපකරණ මිලදී ගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 ඉක්මන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් ගිවිසුමකට එළඹියයුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ඉ) තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 2.35 ක මිලදී ගැනීම් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා 3.8 මාර්ගෝපදේශය ප්‍රකාරව දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.6 වත්කම් කළමනාකරණය**

**----------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

**----------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් තොරතුරු 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කළයුතුව තිබුණි. විගණන දිනය වූ 2018 මැයි 21 දින ............ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් විසින් ඉදිකිරීම්, ගොඩනැගිලි, ඉඩම් සම්බන්ධ තොරතුරු ද දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිරියත හා යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, ගොඩනැගිලි, ඉඩම්, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සම්බන්ධ තොරතුරු ද කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) වාහන උපයෝජනය**

**----------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වාහන 56 ක් පැවති අතර එම වාහනවලින් කැබ්රථ දෙකක් හැර අනෙකුත් කිලෝමීටර් 763,410 ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.7,091,474 ක් ද වාහන සේවා කිරීම් සඳහා රු.2,971,210 ක් ද වාහන අළුත්වැඩියා සඳහා රු.5,569,751 ක් ද වාහන රක්ෂණය කිරීම සඳහා රු.1,419,701 ක් ද වශයෙන් එකතුව රු.17,052,136 ක් වැයකර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝමීටරයක් සඳහා රු.22.33 ක් (ට්‍රැක්ටරය හා ට්‍රේලරය හැර) වැයකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු සෑම රථයකම ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුව තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කිසිදු රථයක එවැනි ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. ඒ අනුව ධාවන සටහන් ලිවීමේදී භාවිත කරනු ලබන ඉන්ධන

දහනය සම්බන්ධ අගයන්හි නිරවද්‍යාතාවය හා ආර්ථිකභාවය සනාථ කරගැනීමට නොහැකි විය.

(ආ) ඉහත චක්‍රලේඛයේ 3.3 ඡේදයේ සඳහන් පරිදි වාහනවල පාවිච්චි කළ ඉන්ධන ප්‍රමාණය සම්බන්ධව හඳුන්වාදී ඇති ආකෘතිය පවත්වා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අමතරව බාහිර ආයතනවලට අයත් වාහන සඳහා ඉන්ධන ඇණවුම් ලබාගෙන තිබුණද එම ප්‍රමාණයන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හැකිවන ලෙස ලේඛන පවත්වා නොතිබුණි.

(ඈ) දෛනික ධාවන සටහන් අනුව වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා 2017 අගෝස්තු 08 දින සිට 2017 සැප්තැම්බර් 28 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ගරාජයකට යොමුකර තිබුණි. වාහන ලිපි ගොනුව අනුව එවැනි අළුත්වැඩියාවන් සිදුකර නොතිබුණු අතර එම අළුත්වැඩියාවට අදාළ බිල්පත්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) වාහන පිටවීම සහ පැමිණීම සටහන් කිරීමට ගේට්ටුවේ මුර ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ඊ) වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම**

**-----------------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) විධිමත් හා බලාත්මක කළහැකි පරිදි ගිවිසුමකට එළඹීමකින් තොරව හා එළඹෙන ලද ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ගොඩනැගිල්ලක් සමුපකාර සමිතියට කුලියට දීම මගින් 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 5.80 ක කුලියක් හිඟහිට පැවතුණි.

(ii) මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය 2014 අගෝස්තු මාසයේ සිට 2017 ජූලි මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ වෙනත් පාර්ශවයකට පදිංචිය සඳහා ලබාදී තිබුණි. නිවාසයේ පදිංචිකරුවන් පිළිබඳ කිසිදු ලිඛිත තොරතුරක් කාර්යාලය විසින් පවත්වා නොතිබුණු අතර නිවාස කුලී ද අයකරගෙන නොතිබුණි.

**(උ) රජයේ වත්කම්වල වටිනාකම හා ගුණාත්මකභාවය අඩුවීම**

**-----------------------------------------------------------**

මාතර දිස්ත්‍රික්කයේ පුද්ගලයින් හා ආයතන විසින් සන්තකයේ තබාගෙන පාවිච්චි කරනු ලබන ගිණිඅවි සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම දිස්ත්‍රික්

ලේකම් විසින් සිදු කර තිබුණි. ගිණිඅවි 124 ක් සහ ජීව උණ්ඩ 122 ක් නැවත භාරගෙන කාර්යාලීය ගබඩාව තුළ නිසි ආරක්ෂාවක් සහ විධිමත් කාර්ය පටිපාටියකට අනුකූල නොවන ලෙස ගබඩා කර තිබීම නිසා බොහෝ ගිණිඅවි භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවතුණි.

**(ඌ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි - රජයේ නිවාස (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර, වැලිපිටිය) | 04 | දීර්ඝ කාලයක සිට |
| (ii) | ත්‍රිරෝද රථ (තිහගොඩ, කොටපොල) | 02 | වර්ෂ 01 - 02 |
| (iii) | යතුරුපැදි (දික්වැල්ල, මාතර) | 07 | වර්ෂ 02 |

## 2.7 බැදීම් හා බැරකම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**වාර්ෂික අයවැය ප්‍රතිපාදන නොමැතිව බැදීම්වලට එළඹීම**

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයක් සඳහා රු.මිලියන 746.65 ක බැදීම්වලට එළඹ තිබුණි. 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මඟින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. නමුත් පරිපූරක ඇස්තමේන්තුවේ වෙන්කිරීම් මඟින් 2018 වර්ෂයේ රු.මිලියන 158.82 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. 2017 අප්‍රේල් 27 දින අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදයට පටහැනිව රු.මිලියන 687.85 කින් ප්‍රතිපාදන ඉක්මවා බැදීම්වලට එළඹ තිබුණි. එමෙන්ම එම වැය විෂය යටතේ බැරකම් ලෙස රු.මිලියන 174.12 ක් වී තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 15.3 කින් බැරකම්වලටද එළඹ තිබුණි. එමෙන්ම තවත් වැය විෂයයක් සඳහා රු.මිලියන 82.02 ක් බැදීම් ඇතිකරගෙන තිබුණු නමුත් ඒ සඳහා 2018 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

2017 ජනවාරි 01 දින වන විට පළාත් පාලන ආයතනවලට වරිපනම් ගෙවීම සඳහා රු.569,563 ක් බැරකම්වලට එළඹ තිබුණු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම බැරකම් නිරවුල් කර නොතිබුණු අතර 2018 වර්ෂයේදී ඒ සඳහා ප්‍රතිපාදන ලබාගෙන නොතිබුණි.

## 2.8 අවිධිමත් ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරන ලද අවස්ථාවලදී ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවේ සාමාජිකයන්ට දීමනා නොගෙවිය යුතුව තිබූ නමුත් එම විධිවිධානවලට පටහැනිව රු.861,500 ක් වූ අවසාන ලෙස කමිටුවේ සාමාජිකයන්ට ගෙවා තිබුණි.

(ආ) 2017 මැයි මාසයේ ඇති වූ ගංවතුර හා නායයෑම් තත්ත්වය හේතුවෙන් හානියට පත් ප්‍රදේශවල පුනරුත්ථාපනය හා නැවත ඉදිකිරීම් කටයුතු සඳහා රු. මිලියන 1,500 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුගෙන් මිල ගණන් ලබාගෙන රු. මිලියන 50 ක් දක්වා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණි. නමුත් මීට අනුකූල නොවී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස්කරන ලද රු. මිලියන 884.21 ක ඇස්තමේන්තුගත වටිනාකම පදනම් කරගෙන ව්‍යාපෘති 24 ක් නවීකරණ කටයුතු දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණි.

(i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පිළියෙලකර ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු කිසිදු පරීක්ෂාවකින් තොරව දිස්ත්‍රික් ඉංජිනේරු විසින් නිර්දේශ කර තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අධිකාරිය සමඟ එළඹ තිබුණු අවබෝධතා ගිවිසුම අනුව නවීකරණ කටයුතු අධීක්ෂණය දිස්ත්‍රික් ඉංජිනේරු විසින් සිදුකළ යුතු බව දන්වා තිබුණි. දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ අධීක්ෂණයෙන් තොරව කොන්ත්‍රාත්කරුගේ අධීක්ෂණය මත පමණක් මාර්ග නවීකරණ කටයුතු සිදුකර තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ............... නවීකරණ කටයුතු උප කොන්ත්‍රාත් දී තිබුණි. එම සංවර්ධන කටයුතුවල ඇස්තමේන්තුගත වටිනාකම පදනම් කර පිළියෙල කර තිබුණු බිල්පත්, දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි.

(iii) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තුවල ........, .........., ............ යනාදි දෝෂ රාශියක් පවතින බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. අධිකාරිය විසින් ඉ තා මෑතකදී

ඉටුකර තිබුණු එකතුව රු.මිලියන ........ ක් වූ කාර්යයන් ........ ක්, ඉදිරියේදී ක්‍රියාත්මක කිරිමට යොජිත කාර්යයන් ඇතුළත් ඇස්තමේන්තුවල සඳහන් කර රු.මිලියන ........... ක පිරිවැයක් ඇතුළත් කර තිබුණි.

(iv) ඇස්තමේන්තු අනුව යෙදීමට සැලැසුම් කරන ලද අමුද්‍රව්‍ය වෙනුවට මිලෙන් අඩු අමුද්‍රව්‍ය යෙදවූ අවස්ථා ...... ක්ද, විධිමත් අනුමැතියක් ලැබීමට පෙර අමුද්‍රව්‍ය භාවිතා කළ අවස්ථා ......... ක්ද, සපයා මුට්ට කිරීමෙන් පසුව ඇතිරීමට සැලැසුම් කර තිබුණු අමුද්‍රව්‍ය සෘජුව මාර්ගයට යොදවා තිබුණු අවස්ථා ........ ක් විගණනයේදී අනාවරණය විය. එම කිසිදු වෙනස්කිරීමක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවනාගාරයේ නව ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින රු.මිලියන 1.37 ක් ගෙවීම් කර තිබූ නමුත්, 2018 මාර්තු 31 දින වන විටත් එකී කාර්යය ඉටුකර නොතිබුණි.

(ඈ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ආරක්ෂිත කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින රු.586,450 ක් ගෙවා තිබුණි. නමුත් 2018 මාර්තු 31 දින වන විටත් එකී කාර්යය ඉටුකර නොතිබුණි.

## 2.9 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු වී තිබුණු පාඩු හා හානි පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 සිට 2017 දක්වා වර්ෂවල සිදුවී තිබුණු එකතුව රු.මිලියන 4.64 ක් වූ වාහන අනතුරු 33 ක් සිදු වී තිබුණි. එම අනතුරු සිදු වී වර්ෂ 5 ක සිට වර්ෂ 10 කට වැඩි කාල පමාවත් සිදු වී තිබුණු එකතුව රු.997,815 ක අලාභහානි සම්බන්ධයෙන් අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ හඳුනා ගැනීමට නොහැකි අලාභහානි සම්බන්ධයෙන් එම වට්නාකම් පොත්වලින් කපා හැරීමට හෝ 2018 අප්‍රේල් 04 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) වාහන අනතුරු හැර එකතුව රු.මිලියන 15.84 ක් වූ පාඩු හා හානි වර්ෂ 06 ක සිට වර්ෂ 34 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම අලාභහානි වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ අයකර ගැනීමට නොහැකි අලාභහානි පොත්වලින් කපා හැරිමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2018 අප්‍රේල් 04 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සිදුවී තිබුණු එකතුව රු.1,787,379 ක් වූ වාහන අනතුරු 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කර පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත

වර්ෂයේ වාහන 2 කට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හා, මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.10 අනාර්ථික ගනුදෙනු

----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මාතර නිල්වලා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 3.83 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් යොදාගෙන තිබුණු කුට්ටිගල්වල පිළිබඳව සාම්පලවල තත්ත්ව පරීක්ෂණයක් සිදු කර තිබුණි. එම පරීක්ෂණ වාර්තා අනුව පැවතිය යුතු ගුණත්වය සියයට 32 ක සිට 87 ක් දක්වා ඉතා අඩු අගයක පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගාස්තු ලේඛන විධිමත් පරිදි පවත්වා නියමිත කාල වකවානු වල විදුලි හා ජල ගාස්තු ගෙවිය යුතුව තිබුණි. නමුත් ඒ පිළිබඳව අවධානය යොමු නොකිරිම නිසා නියමිත කාල වකවානු වල විදුලි හා ජල ගාස්තු නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.111,010 ක් හා රු.52,918 ක් වශයෙන් එකතුව රු.163,928 ක දඩ හා අධිභාර ගෙවා තිබුණි. එමෙන්ම වරිපනම් ගෙවීමේදී නියමිත කාල වකවානු තුළ ගෙවීමෙන් ලබා ගත හැකිව තිබුණු වට්ටම් වාසිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) ගංවතුරෙන් හානියට පත් මාර්ග/යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය යටතේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 1.42 ක් වියදම් කර ඉදිකළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති දෙකක තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව, නිමකර තිබුණු මාර්ග නියමිත ප්‍රමිතියට නොතිබුණි.

(ඈ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 දෙසැම්බර් 28 දින රු.මිලියන 68.22 ක් වූ වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොඩනැගිල්ල ඉදිකරණ ඉඩමේ අයිතිය පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

(ii) 2018 ජුනි 11 දින වන විටත් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැඩ බිම විධිමත් පරිදි කොන්ත්‍රාත්කරු වෙත භාරදී නොතිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දින වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 15.69 (එකතු කළ අගය මත බදුද ඇතුළුව) ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය පටහැනිව රු.196,650 ක අත්තිකාරම් වැඩියෙන් ගෙවා තිබුණි.

(iv) විගණන දිනය වූ 2018 ජුනි 11 දින වනවිටද ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණු අතර වැඩ අත්තිකාරම් ලෙස ගෙවූ රු.මිලියන 15.69 ක් මාස 05 කට අධික කාලයක් බාහිර පාර්ශවයක් අත රැඳී පැවතුණි.

(v) ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා අනුමැතිය ලබා ගත යුතු ආයතන වෙතින් අවශ්‍ය අනුමැතීන් ලබා නොගැනීම සහ ගොඩනැගිලි සැලැසුම් සකස් කර අනුමැතිය ලබා ගැනීමට පෙර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි.

(ඉ) වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 01 දින රු.9,276,063 ක වටිනාකමකට ගිවිසුම්ගතවී තිබුණි. 2017 නොවැම්බර් 27 දින වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් වශයෙන් රු.2,676,319 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එළඹ තිබුණු ගිවිසුමමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 20 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවිය යුතුව තිබුණත්, ඒ සඳහා සියයට 30 ක ප්‍රමාණයක අත්තිකාරම් ගෙවීම නිසා රු.892,106 ක් වැඩි පුර ගෙවා තිබුණි.

## 2.11 කළමනාකරණ දුර්වලතා

---------------------------

දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කර්මාන්ත 07 ක් සඳහා රු.3,338,394 ක් වැය කර තිබුණි. එම කර්මාන්තය සඳහා යොදා ගෙන තිබුණු ..............ද්‍රව්‍ය අදාළ ප්‍රමිතියට අනුකූල බව තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණාගාරයකට ඉදිරිපත් කර තිබුණි. නමුත් එම සාම්පල නියමිත දින ගණනට වඩා අඩු කාලයකින් පරීක්ෂාගාරයට ඉදිරිපත් කර තිබීම නිසා එම පරීක්ෂණ වාර්තාවල නිවැරදිතාවය හා විශ්වසනීයත්වය තහවුරු වී නොතිබුණි.

## 2.12 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 3.3.2 (ඇ) ඡේදයේ සඳහන් මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොටමුණ ධීවර ජැටිය ඉදිකිරීම සම්බන්ධයෙන් වූ අඩුපාඩු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණි.

## 2.13 මහජනයා වෙත සේවා ඉටු කිරිම

------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ තුළින් අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගේ පැමිණිලි ලබාගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. මහජනයා විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් මහජන පැමිණිලි ලේඛනයක්ද පවත්වා නොතිබුණි.

## 2.14 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**2017 දෙසැම්බර් 31 දිනට**

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 813.04 | 812.18 | 0.86 | 0.11 |
| | මූලධන | 97.69 | 97.56 | 0.13 | 0.13 |
| | **එකතුව** | **910.73** | **909.74** | **0.99** | |
| 2014 | පුනරාවර්තන | 784.15 | 783.55 | 0.6 | 0.08 |
| | මූලධන | 108.76 | 106.67 | 2.09 | 1.92 |
| | **එකතුව** | **892.91** | **890.22** | **2.69** | |
| 2015 | පුනරාවර්තන | 991.54 | 929.72 | 61.82 | 6.23 |
| | මූලධන | 82.81 | 71.22 | 11.59 | 14.00 |
| | **එකතුව** | **1,074.35** | **1,000.94** | **73.41** | |
| 2016 | පුනරාවර්තන | 953.57 | 950.07 | 3.5 | 0.37 |
| | මූලධන | 179.55 | 50.27 | 129.28 | 72.00 |
| | **එකතුව** | **1,133.12** | **1,000.34** | **132.78** | |
| 2017 | පුනරාවර්තන | 889.95 | 887.90 | 2.05 | 0.23 |
| | මූලධන | 2,053.71 | 465.73 | 1,587.98 | 77.32 |
| | **එකතුව** | **2,943.66** | **1,353.63** | **1,590.03** | |

සමාලෝචිත වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට සියයට 84 ක දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.**

## 2.15 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

---

අමාත්‍යාංශ 31 ක්, දෙපාර්තමේන්තු 20 ක් හා කාර්යාල 02 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 3,257.61 ක්, රු.මිලියන170.69 හා රු.මිලියන 22.49 ක් වශයෙන් එකතුව රු. මිලියන 3,450.79 ක ප්‍රතිපාදන ලබා දි තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 2,315.36 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,135.42 ක් හෙවත් සියයට 32.9 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් (කඹුරුපිටිය, මාලිම්බඩ, දික්වැල්ල) විසින් එකතුව රු.මිලියන 11.36 ක උපකරණ මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගොපද සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයට පටහැනිව .........................

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශයට පටහැනිව ....................

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව ....................

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශයට පටහැනිව ....................

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2(අ) මාර්ගෝපදේශයට පටහැනිව ....................

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 මාර්ගෝපදේශයට පටහැනිව ....................

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.4 මාර්ගෝපදේශයට පටහැනිව ....................

(viii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශයට පටහැනිව ....................

(ix) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 මාර්ගෝපදේශයට පටහැනිව ....................

(x) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.3 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xiii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xiv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xvi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xvii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.7 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xviii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(xix) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ....................... කටයුතු කළ යුතු වුවත්, එසේ කටයුතු නොකර එකතුව රු.931,860 ක් වූ උපකරණ මිලදී ගෙන තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.2,054,100 ක සැපයුම් හා සේවා ලබා ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ............................ සිදු කළ යුතු වුවත්, ඊට පටහැනිව ..........

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඊ) මාර්ගෝපදේශයට පටහැනිව .....................

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.4 මාර්ගෝපදේශයට පටහැනිව .....................

(viii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 මාර්ගෝපදේශයට පටහැනිව ....................

(ඇ) ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය විසින් මාතර කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 25.38 ක ප්‍රතිපාදන බෙරුවෙල ප්‍රදේශයේ ඇල මාර්ග 3 ක් නවීකරණය කිරීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 7.53 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. දිස්ත්‍රික් ලේකම්වරයා 2014 දෙසැම්බර් 04 දින දික්වැල්ල ප්‍රාදේශීය සභාව සමග එළඹ තිබුණු අවබෝධතා ගිවිසුම අනුව ව්‍යාපෘතියේ වැඩ 2014 දෙසැම්බර් 30 දිනට පෙර නිමකළ යුතුව තිබුණි. නමුත් ඉදිකිරීම්වල ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කිසිදු විධිමත් අනුමැතියක් නොමැතිව බාහිර හා අමතර වැඩ කොටස්ද සහිතව ඉටුකර තිබුණු කර්මාන්ත 3 ට අදාළ අවසන් බිල්පත් 2016 ඔක්තෝබර් මාසයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණි. එම බිල්පත් අනුව කළවැඩ වටිනාකම ලෙස රු. මිලියන 20.79 ක් ගෙවීම සඳහා නිර්දේශ කර තිබුණි. නමුත් 2017 අගෝස්තු 01 දින හා 02 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී ඉටුකළ වැඩ ප්‍රමාණයට වඩා වැඩි වැඩ ප්‍රමාණයක් සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණි. විගණන විමසුම නිකුත් කිරීමෙන් පසුව සකස් කර තිබූ සංශෝධිත බිල්පත් සමග සැසඳීමේදී කොන්ත්‍රාත්කරුට බිල්පත් මගින් රු.මිලියන 2.40 ක් වැඩිපුර ගෙවීමට නිර්දේශ කර තිබුණි.

(ii) මෙම ඇල මාර්ග තුනෙහිම කොන්ක්‍රීට් කාණුවල පතුල හා බිත්තිවල ප්‍රසාරණ මූට්ටු තබා නොතිබුණු අතර බිත්තිවල වාකවුළු ද තබා නොතිබුණි. විගණනයෙන් පසුව ඇල මාර්ගවල කොටසක බිත්තිවල වාකවුළු සකස් කළ බව ප්‍රකාශ කළද, කොන්ක්‍රීට් බිත්තිවලට යොදා තිබුණු යකඩ කම්බි පරිසරයට විවෘත වන බැවින් කම්බි මල බැඳීමෙන් කොන්ක්‍රීට් බිත්ති පුපුරා යාමේ අවදානමක් පැවැතුණි.

(iii) ඉදිකරන ලද කාණු හරහා නිවාස සහිත ඉඩම්වල එකතුවන ජලය බැස නොයන බවත්, සමහර ස්ථානවල ජලය බැසයාමට මෙම කාණු බාධකයක් වී තිබුණි. මාතර කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ 2017 ජූලි 04 දිනැති අංක MAT/DEL/CMC දරන ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් අමතන ලද ලිපිය

මගින් මෙම ඇල මාර්ග නිසි ප්‍රමිතියකින් යුතුව ඉදිකර නොමැති බවත් මෙමගින් ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනයක් ලැබී නොමැති බවත් දන්වා තිබුණි. එම හේතු මත ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම නිර්දේශ කළ නොහැකි බවද දන්වා තිබුණි.

(ඈ) දෙයියන්දර නව ප්‍රාථමික විද්‍යාලය සඳහා ගොඩනැගිලි 3 ක්, වැසිකිළි පද්ධතියක් හා ආබාධිත සිසුන් සඳහා අඩි 70x25 ප්‍රමාණයේ ගොඩනැගිල්ලේ අදියර 1 ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.මිලියන 40 ක ප්‍රතිපාදන හා 2015 වර්ෂයේදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 6.8 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඒ සඳහා රු.මිලියන 35.72 ක් වැයකර තිබුණි. දකුණු පළාත් සභාවේ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අනුමැතියක් රහිතව ඉදිකර තිබුණු මෙම ඉදිකිරීම් තුළ ප්‍රාථමික විද්‍යාලයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් හා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මත දකුණු පළාත් අධ්‍යාපන බලධාරීන් මෙම ඉදිකිරීම් භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් ක්‍රියාත්මක කරන ලද අන්තර් සම්බන්ධිත කුට්ටිගල් අතුරා නවීකරණය කරන ලද ව්‍යාපෘති 30 ක් සඳහා විධිමත් පරිදි අනුමත නොකළ ඒකක මිල ගණන් මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් රු.මිලියන 1.06 ක් වැඩිපුර ගෙවා කර තිබුණි.

(ඊ) 2014 වර්ෂයේ අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ක්‍රියාත්මක කර තිබුණි. ඒ යටතේ මාතර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන සම්බන්ධයෙන් මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත දැක්වෙන අඩුපාඩු අනාවරණය විය.

(i) යතුරුපැදි ලබාදුන් නිලධාරීන් වෙනුවෙන් ලබාදුන් යතුරුපැදිය පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් වෙන් වෙන් වශයෙන් වූ ලිපිගොනු වර්ෂ 05 ක් ගත වන තුරු පවත්වා ගෙන යායුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) යතුරුපැදි ලබාගත් නිලධාරියෙකු වර්ෂ 05 ක් ගතවීමට ප්‍රථම වැටුප් රහිත නිවාඩු මත හෝ මාස 06 කට වැඩි කාලයක් වැටුප් සහිත නිවාඩු ලබාගෙන හෝ විදේශගත වන්නේ නම් යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම අයකළ යුතුය. එලෙස විදේශගත වූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 579,680 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

(iii) යතුරුපැදි ලබාගත් නිලධාරියෙකු වර්ෂ 05 ක් ගත වීමට ප්‍රථම යතුරුපැදි හිමි නොවන තනතුරකට යාමේදී සහ ඉල්ලා අස්වීමේදී යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම එම නිලධාරියාගෙන් අයකර ගත යුතුව තිබුණි. යතුරුපැදි හිමි නොවන තනතුරුවලට පත්වීම් ලැබූ නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.1,378,520 ක් එසේ අයකරගෙන නොතිබුණි.

(iv) 2014 ජුනි 30 දිනට ඉදිරි සේවා කාලය වර්ෂයකට අඩු නිලධාරීන්ට යතුරුපැදි ලබා දීමේදී රු.100,000 ක් අයකළ යුතුව තිබුණි. කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවැනි නිලධාරියෙකුගෙන් රු.50,000 ක් පමණක් අයකර යතුරුපැදිය ආපසු ලබා දී තිබුණි.

(v) මෙම වැඩසටහන යටතේ ලබාදුන් සියලු යතුරුපැදි සඳහා වර්ෂ 05 ක් ගතවන තුරු ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවෙන් හෝ ජාතික රක්‍ෂණ භාර අරමුදල මගින් හෝ පූර්ණ රක්‍ෂණාවරණයක් ලබාගත යුතුව තිබුණි. නමුත් නිලධාරීන් බහුතරයක් ඊට අනුකූලව කටයුතු නොකර තුන්වන පාර්ශව රක්‍ෂණාවරණයක් ලබාගෙන තිබුණි. මේ පිළිබඳව පසුවිපරම් ක්‍රියාමාර්ග කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් ගෙන නොතිබුණි.

(උ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ආපදා කළමනාකරණ ඒකකය, දික්වැල්ල ප්‍රාදේශීය සභාව හා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව දික්වැල්ල බෙරුවෙල විල්යාය ප්‍රදේශයේ වැසි ජල කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. මෙම භූමිය සංවර්ධනයට, වැව හෑරීමට, කඩකාමර ඉදිකිරීමට සහ වැසිකිළි පද්ධතිය සඳහා රු.මිලියන 27.48 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විල ආශ්‍රිතව පදිංචි පවුල් 123 ක් අතරින් පවුල් 20 ක නියදියක් තෝරාගෙන ප්‍රශ්නාවලියක් ලබා දී ඔවුන්ගේ අදහස් ලබාගෙන ඒ අනුව ව්‍යාපෘති වාර්තාව සකස් කළ බව සඳහන් කර තිබුණත්, එකී දත්ත පත්‍රිකා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මෙම ව්‍යාපෘතියේ සැලැසුම් අදියරේදී ලබාගත යුතු තාක්‍ෂණික දැනුම උපදෙස් හා අනුමැතීන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, පහත් බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ආදී රාජ්‍ය ආයතනවලින් ලබාගෙන තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයට පමණක් ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් 2011 සැප්තැම්බර් 19 දින එකඟතාවය ලබා දී තිබුණි. එම ලිපිය මඟින් වැව හෑරීමේදී ඇතිවිය හැකි අහිතකර පාරිසරික බලපෑම් පිළිබඳ වැඩිදුරටත් අවධාරණය කර තිබුණද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(iii) වැසිජල කළමනාකරණ ව්‍යාපෘතිය මෙන්ම යෝජිත වැවුරුකන්නල පූජා භූමි සංවර්ධන ව්‍යාපෘතියට අයත් කාර්යයන් සඳහා බෙරුවෙල විල්යාය නැමති හෙක්ටයාර් 10.9466 ක්වූ වගුරුබිම සහිත භූමිය දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 460 පරිච්ඡේදය ප්‍රකාර 2013 අංක 133 දරන ආඥාව පරිදි අංක 1809/23 දරන 2013 මැයි 10 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයට අනුව රජයට පවරාගෙන තිබුණි. එහෙත් ඉඩම් හිමියන්ට වන්දි ගෙවීමට අදාළ වන්දි තක්සේරු කිරීම සහ ඉදිරි කටයුතු 2017 අගෝස්තු 29 දින වන විටත් නිමකර නොතිබුණි.

(iv) 2017 අගෝස්තු 29 දින වන විට මෙම වැව, වල්බිහිවී ජලජ පැලෑටි හා කඩොලාන ශාඛා වැවී තිබුණි.

(v) වැසි ජලය රැස්වන ආකාරයට වගුරු බිම පවත්වාගෙන යාමට සැලසුම් කර තිබුණද, 2010 වර්ෂයේදී රු.2,667,601 ක් වැයකර මෙම ප්‍රදේශයේ පස් පුරවා ගොඩකර තිබුණි. එසේම මාතර කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය මගින්ද මෙම භූමියට පස් පිරවීම සිදුකර තිබුණි.

(vi) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සිදු කර තිබුණු වියදම ඵලදායි ලෙස උපයෝජනය කිරීමක් 2017 දෙසැම්බර් මාසය වන විටත් සිදු කර නොතිබුණි. එසේම මෙම වියදමේ ප්‍රතිලාභ ප්‍රදේශවාසීන්ට ලැබී නොතිබුණු අතර ප්‍රදේශවාසීන් මුහුණ දුන් ගංවතුර අවදානමටද විසඳුමක්ද ලැබී නොතිබුණි.

(ඐ) දෙනියාය සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 15.94 ක් වැයකර සංචාරක නිවාසය ඉදිකර තිබුණු අතර 2018 මාර්තු 31 දින වන විටත් ඉන් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් යොදා නොගෙන නිශ්ක්‍රීයව පැවැතුණි. නිවාසය සඳහා රු.මිලියන 1.52 ක් වටිනා ගෘහ භාණ්ඩ ඇතුළු උපකරණ මිලදී ගෙන තිබුණත්, එම භාණ්ඩ හා උපකරණ භාවිතයට ගෙන නොතිබුණි. එසේම සංචාරක නිවාසය ඉදිකර තිබුණු ඉඩම නිරවුල් කර ගැනීමේ කටයුතු ද සම්පූර්ණ කර නොතිබුණි.

(එ) 2014 වර්ෂයේ පළාත් නැඟුම සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබුණු 2017 වර්ෂයටද අවිච්ඡේද වූ රු.මිලියන 127.63 ක් වැය කර ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති 2017 දෙසැම්බර් 31 දින වන විටද මහජන අවශ්‍යතාවයන් සඳහා යොදා ගෙන නොතිබුණි. තවද මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව වැඩ අත්තිකාරම් ගෙවා තිබුණු අතර, එම අත්තිකාරම්වලට හා කාර්යසාධන සුරක්ෂණය ලබාගැනීමද සිදු කර නොතිබුණි. එමෙන්ම ඉදිකිරීම්වල පැවති අඩුපාඩු නිවැරදි නොකිරීම සහ ඇතැම් වැඩ කොටස් නියමිත ප්‍රමිතියට ඉදිකර නොතිබුණු අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිසි අධීක්ෂණයක්ද සිදුකර නොතිබුණි.

(ඔ) 2015 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ වැවුරුකන්නල පූජාභූමි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 22.52 ක් වියදම් කර කඩ කාමර 16 ක් සහ වැසිකිළි පද්ධතියක් ඉදිකර තිබුණි. එම ඉදිකිරීම් සිදු කර වර්ෂ 05 ක කාලයක් ගත වී තිබුණද මහජන අවශ්‍යතාවයන් සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. තවද උක්ත වියදම තුළ ඇතුළත් මාතර තානායම ප්‍රතිසංස්කරණය සඳහා දරන ලද රු.මිලියන 1.06 ක් වූ වියදම ආර්ථික වශයෙන් ඵලදායී වී නොතිබුණි. එමෙන්ම උක්ත ඉදිකිරීම් සඳහා වැඩිපුර ගෙවන ලද රු.281,404 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතුව පැවති නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එම මුදල ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) දක්ෂිණ කලාපීය ආර්ථික සම්පත් තිරසාර ලෙස උපයෝගී කරගනිමින් කලාපීය ජන ජීවිතය නගාසිටුවීම සඳහා 2017 අයවැය යෝජනාව අනුව මාතර දිස්ත්‍රික්කය

තුළ ව්‍යාපෘති 519 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 382.98 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ඉන් රු.මිලියන 365 ක් වූ ව්‍යාපෘති 506 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

- මෙම වැඩසටහන යටතේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු රු.13,115,038 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 12 ක තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව නියමිත ප්‍රමිතියට නොතිබුණු හෙයින් දරන ලද වියදම ආර්ථික වශයෙන් ඵලදායී වී නොතිබුණි.

- මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට අනුමත වූ රු.මිලියන 70.10 ක ව්‍යාපෘති 76 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 28.30 ක් වූ ව්‍යාපෘති 41 ක් ද ක්‍රියාත්මක කිරීමට නොහැකිව අවිච්ඡේද කිරීමට සිදුවී තිබුණද 2018 මැයි 31 දින වනවිටද මෙම ව්‍යාපෘති සඳහා 2018 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්වී නොතිබුණි.

(viii) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේ මාණ්ඩලික නොවන මට්ටමේ නිලධාරීන්ගේ හැකියා වර්ධනය වෙනුවෙන් වැඩසටහන් 89 ක් පැවැත්වීමට රු.1,283,650 ක ඇස්තමේන්තු කර තිබුණි. මෙම ඇස්තමේන්තුවේදී ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 01 දින වූ අතර එහි පළමු පියවර ලෙස වැඩසටහන් 18 ක් සඳහා රු.275,425 ක් වූ ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් වැඩසටහන් 12 ක් පවත්වා තිබූ අතර තවදුරටත් සියයට 40 ක ප්‍රතිපාදන එනම් රු.111,400 ක් වැය නොකර ඉතිරිවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නිලධාරීන්ගේ හැකියා වර්ධනය වෙනුවෙන් සැළසුම් සකස් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා කටයුතු ඵලදායී ලෙස සිදුවී නොතිබුණි. පැවැත්වූ වැඩසටහන් සඳහා සහභාගීත්වය අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 50 ක් පමණක් වී තිබුණි.

**2.14 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-----------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිමසීමාව | තථ්‍ය |

------------

| | | | | | |
|---|---|---|---|---|---|
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 109.00 | 108.95 | 57.00 | 59.10 | 250.00 | 235.49 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

-----------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 238,163 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 05 ක සිට වර්ෂ 12 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.15 අග්‍රිම ගිණුම

-------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසිකව ලබා ගැනිමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසිකව ඉල්ලුම්කළ අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| **මාසය** | **සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළයුතු අග්‍රිමය** | **ඉල්ලුම් කළ අග්‍රිමය** | **ලැබී තිබුණු අග්‍රිමය** | **සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළයුතු හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස** | **ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස** |
|---|---|---|---|---|---|
| ------------- | --------------- | --------------- | -------------- | රු. මිලියන ---------------- | -------------- |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | | රු. මිලියන |
| ජනවාරි | 112.98 | 199.54 | 227.20 | (86.56) | (27.66) |
| පෙබරවාරි | 172.98 | 216.83 | 224.52 | (43.85) | (7.69) |
| මාර්තු | 172.98 | 299.44 | 287.47 | (126.46) | 11.97 |
| අප්‍රේල් | 181.98 | 231.39 | 248.35 | (49.41) | (16.96) |
| මැයි | 172.98 | 273.80 | 283.85 | (100.82) | (10.05) |
| ජුනි | 232.98 | 301.55 | 345.69 | (68.58) | (44.13) |
| ජූලි | 232.98 | 274.39 | 674.74 | (41.41) | (400.35) |
| අගෝස්තු | 292.98 | 868.78 | 785.74 | (575.8) | 83.04 |
| සැප්තැම්බර් | 292.98 | 794.91 | 424.58 | (501.93) | 370.33 |
| ඔක්තෝබර් | 292.98 | 1,215.97 | 323.15 | (922.99) | 892.82 |
| නොවැම්බර් | 299.08 | 1,636.74 | 403.15 | (1,337.66) | 1,233.59 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් | 114.58 | 3,245.38 | 956.76 | (3,130.80) | 2,288.62 |
| | ----------- | ---------- | ------------ | ------------- | -------------- |
| එකතුව | 2,572.46 | 9,558.72 | 5,185.20 | 6,986.26 | (4,373.52) |
| | ======== | ======== | ======== | ======== | ======= |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අරම්භයේදී පිළියෙල කළ අග්‍රිම ඇස්තමේන්තුව රු. මිලියන 2,572.46 ක් වූ අතර ඉල්ලුම් කළ අග්‍රිමය රු. මිලියන 9,558.72 ක් වී තිබුණි. ඒ අනුව සැළසුම් කළ අග්‍රිමයෙන් සියයට 372 ක් තරම් ප්‍රමාණයකින් ඉල්ලුම් කළ අග්‍රිමය ඉහළ ගොස් තිබුණි. 2017 වර්ෂයේ අයහපත් කාලගුණය නිසා ඇතිවූ හදිසි ආපදා තත්ත්වය වෙනුවෙන් වෙන්කරන ලද ව්‍යාපෘති 02 ක් සඳහා වූ රු. මිලියන 1,537.84 ක ප්‍රතිපාදනය ඇතුළුව සැළසුම් නොකරන ලද ව්‍යාපෘති සඳහා අග්‍රිම මුදල් ඉල්ලුම් කිරීම හේතුවෙන් ඉහත තත්ත්වය උද්ගතවී තිබුණි. තවද සැළසුම් කළ ප්‍රමාණයට වඩා වෙනත් ශීර්ෂ සඳහා වූ අග්‍රිම අවශ්‍යතාවය ද ඉහළ යාම මේ සඳහා බලපා තිබුණි.

(ii) ඇතැම් ව්‍යාපෘති සඳහා සැළසුම් කළ පරිදි නියමිත කාලවකවානුවල අදාල කාර්යයන් ඉටු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් එම කාර්යයන් වර්ෂය අවසානයේදී ඉටුකිරීමට යොදා ගැනීම නිසා වර්ෂය අවසාන කාර්තුව තුළ පමණක් ඉල්ලුම් කරන ලද අග්‍රිමය සැළසුම් කළ අග්‍රිමයට වඩා සියයට 863 කින් ඉහළ ගොස් තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 10 ක් තුළ වූ කර්මාන්ත 969 ක් සඳහා වන රු. මිලියන 813.21 ක් ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලබා නොදීම හේතුවෙන් එම වටිනාකම අතැති බිල් ලෙස 2018 වර්ෂයේදී ගෙවීම් කිරීමට සිදුවී තිබුණි.

(iv) 2016 දෙසැම්බර් 01 දිනැති අංක 08/2016 භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු යටතේ සලසා දී තිබූ මූල්‍ය ප්‍රතිපාදන පදනම් කරගෙන නියම කර තිබුණු වාර්ෂික අග්‍රිම සීමාව රු. 591,534,426 කින් ඉක්මවා තිබුණි.

## 2.16 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 480.25 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 04 ට අදාලව භාණ්ඩාගාර පොත් අනුව ශේෂය සහ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර වෙනස්කම් පැවති අතර විස්තර පහත දැක්වේ.

| තැන්පතු ගිණුම් වර්ගය | භාණ්ඩාගාර පොත් අනුව ශේෂය | දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ඇප තැන්පතු | 1,449,885 | 1,157,551 | 292,334 |
| තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු | 24,764,333 | 25,022,952 | (258,619) |
| කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල් | 317,204,819 | 317,101,669 | 103,151 |
| වන්දි ගෙවීම | 131,923,426 | 132,060,287 | (136,861) |

(ආ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.206,035,466 ක්වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.2,979,285 ක මුදල් අදාළ කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) 2003 සිට 2014 දක්වා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 6000-0000-00-0017-0023-000 දරන ගිණුමේ රඳවාගෙන තිබූ ඉඩම් වන්දි රු.37,501,880 ක්, හිමිකම් තහවුරු කරගෙන ගෙවීම් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.17 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දෙවිනුවර, මුලටියන සහ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලේඛන යාවත්කාලීන කර නොතිබුණි.<br><br>තිහගොඩ හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලේඛන පවත්වා නොතිබුණි. |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(ඇ) | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

## 2.18 අනුකූල නොවීම්
-----------------

**2.18.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| xix පරිච්ඡේදයේ 4.1 උපවගන්තිය | 4.1 වගන්තියට පටහැනිව නිලධාරීන් 04 දෙනෙකු වෙත නිවාස වෙන්කරදී තිබීම. |
| xix පරිච්ඡේදයේ 4.3.1 උපවගන්තිය | නිවාස ඉල්ලුම්පත්‍ර 15 ක නිවැරදිතාවය දෙපාර්තමේන්තු හෝ උපකාර්යාලයේ ප්‍රධානියා මගින් තහවුරු කර ඉදිරිපත් කර නොතිබුණු අතර එම අයදුම්පත්‍රලාභීන් 04 දෙනෙකුට නිවාස ලබාදී තිබුණි. |
| xix පරිච්ඡේදයේ 4.4 උපවගන්තිය | නිවාස වෙන්කරදීමේදී නිවාස කමිටුවකින් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම |
| xix පරිච්ඡේදයේ 5.4 උපවගන්තිය හා 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | උපලේඛනගත නිවාස හිමිකමක් නැති නිලධාරීන්ගේ කලත්‍රයා රජයේ සේවයේ නියුක්ත වේනම් 2016 පෙබරවාරි 02 දින දක්වා දෙදෙනා ගෙන්ම කුලී අයකළ යුතු වුවද නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් අවස්ථා 02 කදී එසේ කටයුතු කර නොතිබුණි. |
| xix පරිච්ඡේදයේ 6.1 වගන්තිය | රජයේ නිවාසවල බදු කාලය අවුරුදු 05 ක් වුවද එම කාලය ඉක්මවා තිබූ නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා ගණනාවකදී කාලය දීර්ඝ කර තිබුණි. |

## 2.19 මානව සම්පත් කළමනාකරණය

### 2.19.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 781.7 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.488,842 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 50 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 39 | 21 | 18 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1482 | 1385 | 99 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 157 | 142 | 15 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 01 | - | 01 |
| | | 1734 | 1599 | 138 | 03 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අවශ්‍යතාවය ඉක්මවා කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 138 ක් පැවැතියද, 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි.

**(ආ) කාර්ය මණ්ඩල පුහුණු කිරීම**

සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා වූ සියළු ප්‍රතිපාදනයන් උපයෝජනය කර තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 73 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක නිලධාරීන් 594 දෙනෙකු කිසිදු ආකාරයේ පුහුණුවක් ලබා නොතිබූ බව නිරීක්ෂණය විය.